# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2025 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2025 පෙබරවාරි මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2025 පෙබරවාරි මස 21 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැක.

**මිල : රු. 30.00** | **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2025 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත

**[සහතිකය සටහන් කළේ 2025 පෙබරවාරි මස 17 වන දින]**

එල්.ඩී.-ඕ 76/2024

**ඡන්ද විමසීම් කැඳවනු ලැබ සහ කල් තබා ඇත්තා වූ ඇතැම් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් අලුතින් නාමයෝජනා කැඳවීම සඳහා සහ එම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ද පනතකි.**

පූර්විකාව

මෙහි උපලේඛනයේ දක්වා ඇති පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම් සම්බන්ධයෙන් නාමයෝජනා පත්‍ර භාරගනු ලබන බවට නාමයෝජනා දැන්වීම් (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ පළ කරනු ලැබ ඇති හෙයින් ද:

ඉහත කී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා 2023 මාර්තු මස 9 වන දිනය නියම කරන ලද හෙයින් ද:

එකී ඡන්ද විමසීම් එම දිනයේ දී නොපවත්වන ලද හෙයින් ද:

ඉහත කී පළාත් පාලන ආයතන සඳහා නාමයෝජනා භාර දීමේ දිනය 2023 ජනවාරි මාසයේ දී අවසන් වූ හෙයින් සහ අලුත් ඡන්ද හිමියකු වශයෙන් 2024 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇති තැනැත්තන් සඳහා අලුතින් ඡන්ද විමසීම් පැවැත්වීමට නියම කරන ලද දිනයේ දී ඡන්දය භාවිත කිරීමේ ස්වකීය අයිතිය අහිමිවීම වැළැක්වීම සඳහා සහ මෙහි උපලේඛනයේ දක්වා ඇති ඉහත කී පළාත් පාලන ආයතනවලට තෝරා පත්කර ගැනීම සඳහා නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කිරීමේ ස්වකීය අයිතිය අහිමිවීම වැළැක්වීම සඳහා විධිවිධාන සැලැස්වීමේ අවශ්‍යතාවය පැනනැගී ඇති හෙයින් ද:

2023 අංක 30 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත 2023 නොවැම්බර් මස 17 වන දින ක්‍රියාත්මක වී ඇති හෙයින් සහ මෙහි උපලේඛනයේ දක්වා ඇති පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් අලුතින් ඡන්ද විමසීම් පැවැත්වීමේ දී, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ තරුණ අපේක්ෂකයන්ගේ නාමයෝජනා සම්බන්ධයෙන් වූ විධිවිධාන ප්‍රකාරව තරුණ අපේක්ෂකයන් විසින් නාමයෝජනා සිදු කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම අවශ්‍ය වී ඇති හෙයින් ද:

මෙහි උපලේඛනයේ දක්වා ඇති පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් නාමයෝජනා භාරදීමේ කාලසීමාව අවසන් වීම හේතුවෙන්, මෙහි උපලේඛනයේ දක්වා ඇති එකී පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් අලුතින් නාමයෝජනා කැඳවීම සඳහා සහ අලුතෙන් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීමට අවශ්‍ය වී ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

PL 15049 - 150 (2025/02)

# 2025 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත

ලුහුඬු නාමය

**1.** මේ පනත 2025 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඇතැම් පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම් සම්බන්ධයෙන් නාමයෝජනා, දැන්වීම් සහ තැන්පතුවලට අදාළ විධිවිධාන

**2.** (1) (මෙහි මින් මතු "ආඥාපනත" යනුවෙන් සඳහන් කරනු ලබන) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ පළ කරන ලද නාමයෝජනා දැන්වීම් ප්‍රකාරව මෙහි උපලේඛනයේ දක්වා ඇති පළාත් පාලන ආයතන සම්බන්ධයෙන්, ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ 2023 මාර්තු මස 9 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍ර, කිසිවිටෙකත් ඉදිරිපත් කරනු නොලැබුවාක් මෙන් වලංගු නොවන හා බලාත්මක නොවන ලෙස මෙයින් සලකනු ලැබේ.

(2) මෙහි උපලේඛනයේ දක්වා ඇති පළාත් පාලන ආයතන සඳහා වන ඡන්ද විමසීම් සම්බන්ධයෙන්, ආඥාපනතේ 38 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීම් මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

(3) ආඥාපනතේ 30 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, මෙහි උපලේඛනයේ දක්වා ඇති පළාත් පාලන ආයතනවලට තෝරා පත්කර ගැනීම සඳහා යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නම් කරනු ලැබූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් ආඥාපනතේ 29 වන වගන්තිය යටතේ කරනු ලැබූ තැන්පතු, ආඥාපනතේ 29 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ, එම තැන්පතුව සිදු කරනු ලැබූ තැනැත්තා වෙත නිකුත් කරන ලද ලදුපත, එම තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබූ විට එම තැනැත්තා වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

ඡන්ද පැවැත්වීම සඳහා ආරම්භ කළ යුතු පියවර

**3.** මෙහි උපලේඛනයේ දක්වා ඇති පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වන ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා ආඥාපනතේ විධිවිධාන යටතේ පියවර ගැනීම ආරම්භ කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ආඥාපනතේ 26 වන වගන්තිය ප්‍රකාරව, නාමයෝජනා දැන්වීම් මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි දිනයක දී පළ කළ යුතු අතර, එම දිනය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස තුනකට පසු දිනයක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | | *පළාත් පාලන ආයතනය* |
|---|---|---|
| **(01) කොළඹ** | 1 | කොළඹ මහා නගර සභාව |
| | 2 | දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව |
| | 3 | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව |
| | 4 | කඩුවෙල මහා නගර සභාව |
| | 5 | මොරටුව මහා නගර සභාව |
| | 6 | කොලොන්නාව නගර සභාව |
| | 7 | සීතාවකපුර නගර සභාව |
| | 8 | මහරගම නගර සභාව |
| | 9 | කැස්බෑව නගර සභාව |
| | 10 | බොරලැස්ගමුව නගර සභාව |
| | 11 | කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව |
| | 12 | සීතාවක ප්‍රාදේශීය සභාව |
| | 13 | හෝමාගම ප්‍රාදේශීය සභාව |
| **(02) ගම්පහ** | 1 | මීගමුව මහා නගර සභාව |
| | 2 | ගම්පහ මහා නගර සභාව |
| | 3 | වත්තල- මාබෝල නගර සභාව |
| | 4 | කටුනායක-සීදූව නගර සභාව |
| | 5 | මිනුවන්ගොඩ නගර සභාව |
| | 6 | ජා ඇල නගර සභාව |
| | 7 | පෑලියගොඩ නගර සභාව |
| | 8 | වත්තල ප්‍රාදේශීය සභාව |
| | 9 | කටාන ප්‍රාදේශීය සභාව |
| | 10 | දිවුලපිටිය ප්‍රාදේශීය සභාව |
| | 11 | මීරිගම ප්‍රාදේශීය සභාව |
| | 12 | මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව |
| | 13 | අත්තනගල්ල ප්‍රාදේශීය සභාව |
| | 14 | ගම්පහ ප්‍රාදේශීය සභාව |
| | 15 | ජා ඇල ප්‍රාදේශීය සභාව |
| | 16 | මහර ප්‍රාදේශීය සභාව |
| | 17 | දොම්පෙ ප්‍රාදේශීය සභාව |
| | 18 | බියගම ප්‍රාදේශීය සභාව |
| | 19 | කැලණිය ප්‍රාදේශීය සභාව |
| **(03) කළුතර** | 1 | පානදුර නගර සභාව |
| | 2 | හොරණ නගර සභාව |
| | 3 | කළුතර මහා නගර සභාව |
| | 4 | බේරුවල නගර සභාව |
| | 5 | පානදුර ප්‍රාදේශීය සභාව |
| | 6 | බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව |
| | 7 | හොරණ ප්‍රාදේශීය සභාව |
| | 8 | මදුරාවල ප්‍රාදේශීය සභාව |
| | 9 | බුලත්සිංහල ප්‍රාදේශීය සභාව |
| | 10 | මතුගම ප්‍රාදේශීය සභාව |
| | 11 | දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව |

| *දිස්ත්‍රික්කය* | | *පළාත් පාලන ආයතනය* |
|---|---|---|
| | 12 | කළුතර ප්‍රාදේශීය සභාව |
| | 13 | බේරුවල ප්‍රාදේශීය සභාව |
| | 14 | පාලින්දනුවර ප්‍රාදේශීය සභාව |
| | 15 | අගලවත්ත ප්‍රාදේශීය සභාව |
| | 16 | වලල්ලාවිට ප්‍රාදේශීය සභාව |
| | 17 | මිල්ලනිය ප්‍රාදේශීය සභාව |
| **(04) මහනුවර** | 1 | මහනුවර මහා නගර සභාව |
| | 2 | වත්තේගම නගර සභාව |
| | 3 | කඩුගන්නාව නගර සභාව |
| | 4 | ගම්පොල නගර සභාව |
| | 5 | නාවලපිටිය නගර සභාව |
| | 6 | තුම්පනේ ප්‍රාදේශීය සභාව |
| | 7 | හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව |
| | 8 | අකුරණ ප්‍රාදේශීය සභාව |
| | 9 | පූජාපිටිය ප්‍රාදේශීය සභාව |
| | 10 | පාතදුම්බර ප්‍රාදේශීය සභාව |
| | 11 | පන්විල ප්‍රාදේශීය සභාව |
| | 12 | උඩදුම්බර ප්‍රාදේශීය සභාව |
| | 13 | මිනිපේ ප්‍රාදේශීය සභාව |
| | 14 | මැදදුම්බර ප්‍රාදේශීය සභාව |
| | 15 | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව |
| | 16 | පාතහේවාහැට ප්‍රාදේශීය සභාව |
| | 17 | මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව |
| | 18 | යටිනුවර ප්‍රාදේශීය සභාව |
| | 19 | උඩුනුවර ප්‍රාදේශීය සභාව |
| | 20 | උඩපළාත ප්‍රාදේශීය සභාව |
| | 21 | ගඟ ඉහල කෝරළේ ප්‍රාදේශීය සභාව |
| | 22 | පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව |
| **(05) මාතලේ** | 1 | දඹුල්ල මහා නගර සභාව |
| | 2 | මාතලේ මහා නගර සභාව |
| | 3 | පල්ලේපොල ප්‍රාදේශීය සභාව |
| | 4 | ගලේවෙල ප්‍රාදේශීය සභාව |
| | 5 | දඹුල්ල ප්‍රාදේශීය සභාව |
| | 6 | අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව |
| | 7 | නාඋල ප්‍රාදේශීය සභාව |
| | 8 | ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව |
| | 9 | විල්ගමුව ප්‍රාදේශීය සභාව |
| | 10 | මාතලේ ප්‍රාදේශීය සභාව |
| | 11 | යටවත්ත ප්‍රාදේශීය සභාව |
| | 12 | උකුවෙල ප්‍රාදේශීය සභාව |
| | 13 | රත්තොට ප්‍රාදේශීය සභාව |
| **(06) නුවරඑළිය** | 1 | නුවරඑළිය මහා නගර සභාව |
| | 2 | හැටන් දික්ඔය නගර සභාව |
| | 3 | තලවකැලේ ලිඳුල නගර සභාව |

| *දිස්ත්‍රික්කය* | | *පළාත් පාලන ආයතනය* |
|---|---|---|
| | 4 | මස්කෙළිය ප්‍රාදේශීය සභාව |
| | 5 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව |
| | 6 | අඹගමුව ප්‍රාදේශීය සභාව |
| | 7 | ආගරපතන ප්‍රාදේශීය සභාව |
| | 8 | කොටගල ප්‍රාදේශීය සභාව |
| | 9 | නුවරඑළිය ප්‍රාදේශීය සභාව |
| | 10 | කොත්මලේ ප්‍රාදේශීය සභාව |
| | 11 | හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව |
| | 12 | වලපනේ ප්‍රාදේශීය සභාව |
| **(07)** ගාල්ල | 1 | ගාල්ල මහා නගර සභාව |
| | 2 | අම්බලන්ගොඩ නගර සභාව |
| | 3 | හික්කඩුව නගර සභාව |
| | 4 | බලපිටිය ප්‍රාදේශීය සභාව |
| | 5 | අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව |
| | 6 | වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව |
| | 7 | කරන්දෙනිය ප්‍රාදේශීය සභාව |
| | 8 | බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| | 10 | නෙළුව ප්‍රාදේශීය සභාව |
| | 11 | තවලම ප්‍රාදේශීය සභාව |
| | 12 | නාගොඩ ප්‍රාදේශීය සභාව |
| | 13 | නියාගම ප්‍රාදේශීය සභාව |
| | 14 | බද්දේගම ප්‍රාදේශීය සභාව |
| | 15 | යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව |
| | 16 | රජගම ප්‍රාදේශීය සභාව |
| | 17 | අක්මීමණ ප්‍රාදේශීය සභාව |
| | 18 | බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව |
| | 19 | ඉමදූව ප්‍රාදේශීය සභාව |
| | 20 | හබරාදූව ප්‍රාදේශීය සභාව |
| **(08)** මාතර | 1 | මාතර මහා නගර සභාව |
| | 2 | වැලිගම නගර සභාව |
| | 3 | පිටබැද්දර ප්‍රාදේශීය සභාව |
| | 4 | කොටපොල ප්‍රාදේශීය සභාව |
| | 5 | කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව |
| | 6 | මුලටියන ප්‍රාදේශීය සභාව |
| | 7 | පස්ගොඩ ප්‍රාදේශීය සභාව |
| | 8 | අතුරලිය ප්‍රාදේශීය සභාව |
| | 9 | අකුරැස්ස ප්‍රාදේශීය සභාව |
| | 10 | මාලිම්බඩ ප්‍රාදේශීය සභාව |
| | 11 | හක්මණ ප්‍රාදේශීය සභාව |
| | 12 | කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව |
| | 13 | තිහගොඩ ප්‍රාදේශීය සභාව |
| | 14 | දෙවිනුවර ප්‍රාදේශීය සභාව |
| | 15 | දික්වැල්ල ප්‍රාදේශීය සභාව |
| | 16 | මාතර ප්‍රාදේශීය සභාව |
| | 17 | වැලිගම ප්‍රාදේශීය සභාව |

| *දිස්ත්‍රික්කය* | | *පළාත් පාලන ආයතනය* |
|---|---|---|
| **(09) හම්බන්තොට** | 1 | හම්බන්තොට මහා නගර සභාව |
| | 2 | තංගල්ල නගර සභාව |
| | 3 | වීරකැටිය ප්‍රාදේශීය සභාව |
| | 4 | කටුවන ප්‍රාදේශීය සභාව |
| | 5 | බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව |
| | 6 | තංගල්ල ප්‍රාදේශීය සභාව |
| | 7 | අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාව |
| | 8 | අම්බලන්තොට ප්‍රාදේශීය සභාව |
| | 9 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව |
| | 10 | සූරියවැව ප්‍රාදේශීය සභාව |
| | 11 | හම්බන්තොට ප්‍රාදේශීය සභාව |
| | 12 | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව |
| **(10) යාපනය** | 1 | යාපනය මහා නගර සභාව |
| | 2 | වැල්වෙට්ටිතුරෙයි නගර සභාව |
| | 3 | පේදුරුතුඩුව නගර සභාව |
| | 4 | චාවකච්චේරිය නගර සභාව |
| | 5 | කාරෙයිනගර් ප්‍රාදේශීය සභාව |
| | 6 | කයිට්ස් ප්‍රාදේශීය සභාව |
| | 7 | ඩෙල්ෆ් ප්‍රාදේශීය සභාව |
| | 8 | වෙලනෙයි ප්‍රාදේශීය සභාව |
| | 9 | වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව |
| | 10 | වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව |
| | 11 | වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව |
| | 12 | වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව |
| | 13 | වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව |
| | 14 | වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව |
| | 15 | පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව |
| | 16 | චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව |
| | 17 | නල්ලූර් ප්‍රාදේශීය සභාව |
| **(11) කිලිනොච්චිය** | 1 | පච්චිලෙප්පලෙ ප්‍රාදේශීය සභාව |
| | 2 | කරච්චි ප්‍රාදේශීය සභාව |
| | 3 | පූනකරි ප්‍රාදේශීය සභාව |
| **(12) මන්නාරම** | 1 | මන්නාරම නගර සභාව |
| | 2 | මන්නාරම ප්‍රාදේශීය සභාව |
| | 3 | නානාට්ටාන් ප්‍රාදේශීය සභාව |
| | 4 | මුසලි ප්‍රාදේශීය සභාව |
| | 5 | මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව |
| **(13) වවුනියාව** | 1 | වවුනියාව මහා නගර සභාව |
| | 2 | වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව |
| | 3 | වෙන්ගලසෙට්ටිකුලම ප්‍රාදේශීය සභාව |
| | 4 | වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව |
| | 5 | වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව |

| *දිස්ත්‍රික්කය* | | *පළාත් පාලන ආයතනය* |
|---|---|---|
| **(14) මුලතිව්** | 1 | මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාව |
| | 2 | තුනුක්කායි ප්‍රාදේශීය සභාව |
| | 3 | පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව |
| | 4 | මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය සභාව |
| **(15)මඩකලපුව** | 1 | මඩකලපුව මහා නගර සභාව |
| | 2 | එරාවූර් නගර සභාව |
| | 3 | කාත්තන්කුඩි නගර සභාව |
| | 4 | කෝරලෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභාව |
| | 5 | එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව |
| | 6 | කෝරලෙයිපත්තු ප්‍රාදේශීය සභාව |
| | 7 | කෝරලෙයිපත්තු උතුර ප්‍රාදේශීය සභාව |
| | 8 | මන්මුනෙයි දකුණ සහ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාව |
| | 9 | මන්මුනෙයි පත්තු ප්‍රාදේශීය සභාව |
| | 10 | මන්මුනෙයි බටහිර (වවුනතිව්) ප්‍රාදේශීය සභාව |
| | 11 | මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව |
| | 12 | පෝරතීව්පත්තු ප්‍රාදේශීය සභාව |
| **(16) අම්පාර** | 1 | අක්කරපත්තු මහා නගර සභාව |
| | 2 | අම්පාර නගර සභාව |
| | 3 | දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව |
| | 4 | දමන ප්‍රාදේශීය සභාව |
| | 5 | උහන ප්‍රාදේශීය සභාව |
| | 6 | මහඔය ප්‍රාදේශීය සභාව |
| | 7 | නාමල්ඔය ප්‍රාදේශීය සභාව |
| | 8 | පදියතලාව ප්‍රාදේශීය සභාව |
| | 9 | නවිදන්වෙලි ප්‍රාදේශීය සභාව |
| | 10 | සම්මන්තුරයි ප්‍රාදේශීය සභාව |
| | 11 | ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව |
| | 12 | අක්කරපත්තු ප්‍රාදේශීය සභාව |
| | 13 | පොතුවිල් ප්‍රාදේශීය සභාව |
| | 14 | අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය සභාව |
| | 15 | ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව |
| | 16 | ලාහුගල ප්‍රාදේශීය සභාව |
| | 17 | කාර්තිව් ප්‍රාදේශීය සභාව |
| | 18 | නින්දවූර් ප්‍රාදේශීය සභාව |
| | 19 | තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව |
| **(17) ත්‍රිකුණාමලය** | 1 | ත්‍රිකුණාමලය මහා නගර සභාව |
| | 2 | කින්නියා නගර සභාව |
| | 3 | වෙරුගල් ප්‍රාදේශීය සභාව |
| | 4 | සේරුවිල ප්‍රාදේශීය සභාව |
| | 5 | කන්තලේ ප්‍රාදේශීය සභාව |
| | 6 | මොරවැව ප්‍රාදේශීය සභාව |

| *දිස්ත්‍රික්කය* | | *පළාත් පාලන ආයතනය* |
|---|---|---|
| | 7 | ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව |
| | 8 | පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව |
| | 9 | ත්‍රිකුණාමල නගරය හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව |
| | 10 | කුච්චවේලි ප්‍රාදේශීය සභාව |
| | 11 | තඹලගමුව ප්‍රාදේශීය සභාව |
| | 12 | මුතූර් ප්‍රාදේශීය සභාව |
| | 13 | කින්නියා ප්‍රාදේශීය සභාව |
| **(18) කුරුණෑගල** | 1 | කුරුණෑගල මහා නගර සභාව |
| | 2 | කුලියාපිටිය නගර සභාව |
| | 3 | ගිරිබාව ප්‍රාදේශීය සභාව |
| | 4 | ගල්ගමුව ප්‍රාදේශීය සභාව |
| | 5 | පොල්පිතිගම ප්‍රාදේශීය සභාව |
| | 6 | නිකවැරටිය ප්‍රාදේශීය සභාව |
| | 7 | කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව |
| | 8 | මහව ප්‍රාදේශීය සභාව |
| | 9 | ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව |
| | 10 | වාරියපොල ප්‍රාදේශීය සභාව |
| | 11 | පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව |
| | 12 | බිංගිරිය ප්‍රාදේශීය සභාව |
| | 13 | උඩුබද්දාව ප්‍රාදේශීය සභාව |
| | 14 | පන්නල ප්‍රාදේශීය සභාව |
| | 15 | කුලියාපිටිය ප්‍රාදේශීය සභාව |
| | 16 | අලව්ව ප්‍රාදේශීය සභාව |
| | 17 | නාරම්මල ප්‍රාදේශීය සභාව |
| | 18 | පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව |
| | 19 | කුරුණෑගල ප්‍රාදේශීය සභාව |
| | 20 | මාවතගම ප්‍රාදේශීය සභාව |
| | 21 | රිදීගම ප්‍රාදේශීය සභාව |
| **(19) පුත්තලම** | 1 | පුත්තලම මහා නගර සභාව |
| | 2 | හලාවත නගර සභාව |
| | 3 | කල්පිටිය ප්‍රාදේශීය සභාව |
| | 4 | පුත්තලම ප්‍රාදේශීය සභාව |
| | 5 | වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව |
| | 6 | කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව |
| | 7 | නවගත්තේගම ප්‍රාදේශීය සභාව |
| | 8 | ආණමඩුව ප්‍රාදේශීය සභාව |
| | 9 | ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව |
| | 10 | හලාවත ප්‍රාදේශීය සභාව |
| | 11 | නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාව |
| | 12 | වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව |

| *දිස්ත්‍රික්කය* | | *පළාත් පාලන ආයතනය* |
|---|---|---|
| **(20)** අනුරාධපුරය | 1 | අනුරාධපුර මහා නගර සභාව |
| | 2 | මැදවච්චිය ප්‍රාදේශීය සභාව |
| | 3 | රඹෑව ප්‍රාදේශීය සභාව |
| | 4 | කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව |
| | 5 | පදවිය ප්‍රාදේශීය සභාව |
| | 6 | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව |
| | 7 | හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව |
| | 8 | ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව |
| | 9 | තලාව ප්‍රාදේශීය සභාව |
| | 10 | නුවරගම්පළාත නැගෙනහිර ප්‍රාදේශීය සභාව |
| | 11 | නුවරගම්පළාත මධ්‍යම ප්‍රාදේශීය සභාව |
| | 12 | නොච්චියාගම ප්‍රාදේශීය සභාව |
| | 13 | රාජාංගනය ප්‍රාදේශීය සභාව |
| | 14 | ගල්නෑව ප්‍රාදේශීය සභාව |
| | 15 | ඉපලෝගම ප්‍රාදේශීය සභාව |
| | 16 | මිහින්තලේ ප්‍රාදේශීය සභාව |
| | 17 | තිරප්පනේ ප්‍රාදේශීය සභාව |
| | 18 | කැකිරාව ප්‍රාදේශීය සභාව |
| | 19 | පලාගල ප්‍රාදේශීය සභාව |
| **(21)** පොළොන්නරුව | 1 | පොළොන්නරුව මහා නගර සභාව |
| | 2 | ඇළහැර ප්‍රාදේශීය සභාව |
| | 3 | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව |
| | 4 | මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව |
| | 5 | ලංකාපුර ප්‍රාදේශීය සභාව |
| | 6 | වැලිකන්ද ප්‍රාදේශීය සභාව |
| | 7 | දිඹුලාගල ප්‍රාදේශීය සභාව |
| | 8 | පොළොන්නරුව ප්‍රාදේශීය සභාව |
| **(22)** බදුල්ල | 1 | බදුල්ල මහා නගර සභාව |
| | 2 | බණ්ඩාරවෙල මහා නගර සභාව |
| | 3 | හපුතලේ නගර සභාව |
| | 4 | මහියංගනය ප්‍රාදේශීය සභාව |
| | 5 | රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව |
| | 6 | සොරණාතොට ප්‍රාදේශීය සභාව |
| | 7 | මීගහකිවුල ප්‍රාදේශීය සභාව |
| | 8 | කන්දකැටිය ප්‍රාදේශීය සභාව |
| | 9 | පස්සර ප්‍රාදේශීය සභාව |
| | 10 | ලුණුගල ප්‍රාදේශීය සභාව |
| | 11 | බදුල්ල ප්‍රාදේශීය සභාව |
| | 12 | හාලිඇල ප්‍රාදේශීය සභාව |
| | 13 | ඌව පරණගම ප්‍රාදේශීය සභාව |
| | 14 | වැලිමඩ ප්‍රාදේශීය සභාව |
| | 15 | බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව |
| | 16 | ඇල්ල ප්‍රාදේශීය සභාව |

| *දිස්ත්‍රික්කය* | | *පළාත් පාලන ආයතනය* |
|---|---|---|
| | 17 | හපුතලේ ප්‍රාදේශීය සභාව |
| | 18 | හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව |
| **(23) මොණරාගල** | 1 | බිබිල ප්‍රාදේශීය සභාව |
| | 2 | මැදගම ප්‍රාදේශීය සභාව |
| | 3 | මඩුල්ල ප්‍රාදේශීය සභාව |
| | 4 | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව |
| | 5 | මොණරාගල ප්‍රාදේශීය සභාව |
| | 6 | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව |
| | 7 | බුත්තල ප්‍රාදේශීය සභාව |
| | 8 | කතරගම ප්‍රාදේශීය සභාව |
| | 9 | වැල්ලවාය ප්‍රාදේශීය සභාව |
| | 10 | තණමල්විල ප්‍රාදේශීය සභාව |
| **(24) රත්නපුර** | 1 | රත්නපුර මහා නගර සභාව |
| | 2 | බලංගොඩ නගර සභාව |
| | 3 | ඇඹිලිපිටිය නගර සභාව |
| | 4 | ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව |
| | 5 | රත්නපුර ප්‍රාදේශීය සභාව |
| | 6 | කුරුවිට ප්‍රාදේශීය සභාව |
| | 7 | පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව |
| | 8 | බලංගොඩ ප්‍රාදේශීය සභාව |
| | 9 | ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව |
| | 10 | ගොඩකවෙල ප්‍රාදේශීය සභාව |
| | 11 | කහවත්ත ප්‍රාදේශීය සභාව |
| | 12 | වැලිගෙපොල ප්‍රාදේශීය සභාව |
| | 13 | නිවිතිගල ප්‍රාදේශීය සභාව |
| | 14 | අයගම ප්‍රාදේශීය සභාව |
| | 15 | කලවාන ප්‍රාදේශීය සභාව |
| | 16 | ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව |
| | 17 | කොලොන්න ප්‍රාදේශීය සභාව |
| **(25) කෑගල්ල** | 1 | කෑගල්ල මහා නගර සභාව |
| | 2 | වරකාපොළ ප්‍රාදේශීය සභාව |
| | 3 | ගලිගමුව ප්‍රාදේශීය සභාව |
| | 4 | කෑගල්ල ප්‍රාදේශීය සභාව |
| | 5 | රඹුක්කන ප්‍රාදේශීය සභාව |
| | 6 | මාවනැල්ල ප්‍රාදේශීය සභාව |
| | 7 | අරණායක ප්‍රාදේශීය සභාව |
| | 8 | යටියන්තොට ප්‍රාදේශීය සභාව |
| | 9 | බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව |
| | 10 | රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව |
| | 11 | දැරණියගල ප්‍රාදේශීය සභාව |
| | 12 | දෙහිඕවිට ප්‍රාදේශීය සභාව |

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි ''ප්‍රකාශන පියස'' හි දී මිල දී ගත හැකි ය.